# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1519/26 – 2007 ඔක්තෝබර් 18 වැනි බ්‍රහස්පතින්දා – 2007.10.18

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී. 21/78.

**1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත**

27 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය වටරැක ආරච්චිලාගේ විශ්වා වර්ණපාල වන මම, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත මේ නියමය මගින් (2007 පෙබරවාරි මස 02 වන දින අංක 1482/26 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද නියමය, මගින් අවසන් වරට (සංශෝධිත) එකී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ඉහත කී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද නියමයක් ලෙස සළකනු ලැබිය යුතු සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලය පිහිටුවනු ලැබූ නියමයේ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන “ පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය ” යන අයිතමයට අනුරූපව එම උපලේඛනයෙහි II වන තීරයේ දැක්වෙන අයිතමවලට ඉක්බිතිවම පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්, එම නියමයේ උපලේඛනය සංශෝධනය කරනු ලැබේ :-

“ 5. පශු ප්‍රජා සෞඛ්‍ය සහ භිෂග්වේද අධ්‍යයන අංශය.” .

මහාචාර්ය වටරැක ආරච්චිලාගේ විශ්වා වර්ණපාල,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2007 ඔක්තෝබර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

11- 154


1A—G 008994— 1930 (2007/10)

එල්.ඩී.බී. 21/78.

### 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත

27 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 27 වන වගන්තියේ (1) උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය වටර.ක ආරච්චිලාගේ විශ්වා වර්ණපාල වන මා විසින්, මේ නියමය මගින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව, කලින් කල සංශෝධිත සබරගමුව විශ්ව විද්‍යාලය හා සම්බන්ධ වූ 1995 නොවැම්බර් මස 07 දින හා අංක 896/2 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ වූ ඉහත කී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද නියෝගයේ (iv) සහ (v) වන ඡේද සහ ඊට ඉක්බිතිවම ඇති උපලේඛනයෙහි I වන සහ II වන තීරවල අන්තර්ගත සියලු සඳහන් කිරීම් ද ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්, එම නියමය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

“ (iv) ඒ විශ්ව විද්‍යාලයට පහත සඳහන් පීඨයන් පවරමි :

(අ) සමාජීය විද්‍යා හා භාෂා පීඨය ;
(ආ) කළමනාකරණ අධ්‍යාපන පීඨය ;
(ඇ) කෘෂිකාර්මික විද්‍යා පීඨය ;
(ඈ) ව්‍යවහාරික විද්‍යා පීඨය ;
(ඉ) භූ විද්‍යාපන පීඨය ; සහ

(v) මෙහි පහත දැක්වෙන උපලේඛනයේ I වන තීරයෙන් විශ්ව විද්‍යාලයට (iv) වන ඡේදය යටතේ පවරා ඇති එකී විශ්ව විද්‍යාලයේ එක් එක් පීඨ, II වන තීරයේ එකී එක් එක් පීඨවල අනුරූප සටහනින් නිශ්චිතව දක්වා ඇති අධ්‍යයන අංශ වලින් සමන්විත විය යුතු බව නිශ්චිතව සඳහන් කරමි.

උපලේඛනය

| *I වන තීරය* පීඨය | *II වන තීරය* අධ්‍යාපන අංශය |
|---|---|
| සමාජීය විද්‍යා හා භාෂා පීඨය | 1. සමාජීය විද්‍යා අධ්‍යයනාංශය<br>2. භාෂා අධ්‍යයනාංශය<br>3. ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයනාංශය |
| කළමනාකරණ අධ්‍යයන පීඨය | 1. ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය,<br>2. ගණකාධිකරණ හා මූල්‍ය අධ්‍යයනාංශය<br>3. සංචාරක කළමනාකරණ අධ්‍යයනාංශය |
| කෘෂිකාර්මික විද්‍යා පීඨය | 1. පශු සම්පත් නිෂ්පාදන අධ්‍යයනාංශය<br>2. කෘෂි අපනයන අධ්‍යයනාංශය<br>3. කෘෂි ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය |
| ව්‍යවහාරික විද්‍යාපීඨය | 1. ස්වාභාවික සම්පත් අධ්‍යයනාංශය<br>2. භෞතීය විද්‍යා සහ තාක්ෂණ අධ්‍යයනාංශය<br>3. ආහාර විද්‍යාව හා තාක්ෂණවේදය අධ්‍යයනාංශය |
| භූ විද්‍යාපන පීඨය | 1. මැනුම් හා භූමිතික අධ්‍යයනාංශය<br>2. සිතියම්කරණ, ඡායාරේඛනමිතික, දුරස්ථ ග්‍රහණ ගෝචර හා භූගෝලීය තොරතුරු පද්ධති අධ්‍යයනාංශය.”. |

මහාචාර්ය වටර.ක ආරච්චිලාගේ විශ්වා වර්ණපාල,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2007 ඔක්තෝබර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

11–155

එල්.ඩී.බී. 21/78.

**1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත**

27 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 27 වන වගන්තියේ (1) උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය වටරැක ආරච්චිලාගේ විශ්වා වර්ණපාල වන මම, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත මේ නියමය මගින් ( 2006 ජුලි මස 22 වන දින අංක 1454/37 දරන *අති විශේෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත ) එකී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ඉහත කී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද නියමයන් ලෙස සලකනු ලැබිය යුතු සහ කැළණිය විශ්ව විද්‍යාලය පිහිටුවනු ලැබූ නියමයේ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන වෛද්‍ය විද්‍යා පීඨයට අනුරූපව එම උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන "ප්‍රජා වෛද්‍ය අධ්‍යයන" අංශය යන අයිතමය වෙනුවට "මහජන සෞඛ්‍ය අධ්‍යයන" අංශය යන අයිතමය ආදේශ කිරීමෙන් එම නියමයේ උපලේඛනය සංශෝධනය කරනු ලැබේ :-

මහාචාර්ය, වටරැක ආරච්චිලාගේ විශ්වා වර්ණපාල,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2007 ඔක්තෝබර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

11-156

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.